මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: BD/ADM/01/01/PERC
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.03.30

## මාධ්‍ය නිවේදනය

### ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධතාවය හා ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා ක්‍රමානුකූල සමාලෝචනයක් මගින් රාජ්‍ය වියදම් තාර්කිකකරණය කිරීම

2023.02.06 වැනි දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධතාවය ඇති කිරීම හා ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම පිණිස ශූන්‍ය පාදක අයවැය ක්‍රමවේදය (Zero Based Budgeting) යොදාගනිමින් ප්‍රධාන අමාත්‍යාංශ 10ක රාජ්‍ය වියදම් තාර්කිකකරණය කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විශේෂඥයන්ගෙන් සමන්විත රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු 10ක් ස්ථාපිත කිරීමට තීරණය කර ඇත.

ශ්‍රී ලංකාව තුළ දීර්ඝ කාලයක් තිස්සේ අනුගමනය කරනු ලැබූ අයවැයකරණ ක්‍රමවේදයන්හි දුර්වලතා කිහිපයක් පවතී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, වසර ගණනාවක් මුළුල්ලේ අත්‍යාවශ්‍ය නොවන, ද්විකරණය වූ සහ ඵලදායී නොවන කාර්යයන් සඳහා මුදල් වෙන් කිරීම සිදුවී ඇත. මේ හේතුවෙන් ප්‍රධාන රේඛීය අමාත්‍යාංශයන්හි මූලික ක්‍රියාකාරකම් හා කාර්යභාරයන් සඳහා බොහෝ විට අරමුදල් ප්‍රමාණවත් නොවීම සිදු වේ. හැකි උපරිම කාර්යක්ෂමතාවයකින් හා ඵලදායී අයුරින් සම්පත් වෙන් කිරීම පවත්නා රාජ්‍ය මූල්‍ය අර්බුදය හේතුවෙන් වඩාත් වැදගත් වී ඇත.

බොහෝ අවස්ථාවලදී වාර්ෂික අයවැය සකස් කිරීමේදී ,පෙර වර්ෂ වල වෙන් කරන ලද සම්පත් වල තාර්කිකත්වය හා සඵලත්වය පිළිබඳ දැඩි සමාලෝචනයක් නොමැතිව පෙර වසරේ අයවැයට වර්ධන ගැළපුම් සිදු කිරීම පදනම් වී ඇත. ශූන්‍ය පාදක අයවැය ක්‍රමවේදය හඳුන්වාදීමේ මෙම ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ මගින් පෙර වර්ෂ වල අයවැය ප්‍රතිපාදන නොසලකන අතර රේඛීය අමාත්‍යාංශ විසින් සම්පත් වෙන් කිරීම් සඳහා සාධාරණීකරණය කිරීම් ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. ඒ අනුව, අවශ්‍යතා, පිරිවැය සහ එවැනි වැය කිරීම් ආශ්‍රිත ප්‍රතිලාභ පිළිබඳ පැහැදිලි ඇගයීමකින් පසුව පමණක් අරමුදල් වෙන් කරනු ලැබේ.

රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු මගින් එක් එක් රේඛීය අමාත්‍යාංශයේ සියළුම වැඩසටහන්/ ව්‍යාපෘති සමාලෝචනය කර, මූලික ක්‍රියාකාරකම් අදාළ අමාත්‍යාංශයේ කාර්යභාරයට අනුකූල වන්නේ ද යන්න පිළිබඳව නිශ්චය කරගනු ලැබේ. තව ද, රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු විසින් ද්විකරණයන්, අපතේ යාම් හා අනවශ්‍ය වියදම් හඳුනාගනු ලබන අතර අමාත්‍යාංශයේ අරමුණු මෙන්ම ජාතික ප්‍රතිපත්ති සාක්ෂාත් කරගැනීම උදෙසා පවතින ශක්‍යතාවය අනුව සියළුම ක්‍රියාකාරකම් ප්‍රමුඛතාගත කරනු ලැබේ. මීට අමතරව, එක් එක් අමාත්‍යාංශය විසින් සිය සේවා සැපයීමේදී ඵලදායීතාවය හා පිරිවැය සඵලත්වය ප්‍රශස්ත කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කළ යුතු කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන ප්‍රතිසංස්කරණ ද මෙම කමිටු විසින් හඳුන්වාදෙනු ලැබේ.

කමිටු සාමාජිකයන් පහත පරිදි වේ;

i. **ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය**
ප්‍රියන්ත රත්නායක මහතා, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්
නිලුපුල් පෙරේරා මහතා, ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
මහාචාර්ය අමල් එස්. කුමාරගේ මහතා, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, මොරටුව විශ්වවිද්‍යාලය
ආචාර්ය ටී. සිවකුමාර් මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මොරටුව විශ්වවිද්‍යාලය
ජිෆ්රි සුල්ෆර් මහතා, ප්‍රධාන විධායක නිලධාරී, PickMe සමාගම (ඩිජිටල් මොබිලිටි සොලියුෂන්ස් ලංකා (පුද්) සමාගම)

ii. **නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය**
ප්‍රියන්ත රත්නායක මහතා, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්
ආචාර්ය එම්.එම්.එස්.එස්.බී. යාලේගම මහතා, අතිරේක ලේකම්, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
මහාචාර්ය ජගත් මුණසිංහ මහතා, නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව, ගෘහ නිර්මාණ ශිල්ප අධ්‍යයන පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය
අජිත් තුඩාවේ මහතා, ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ, සී/ස තුඩාවේ සහෝදරයෝ පුද්ගලික සමාගම
නදුන් ප්‍රනාන්දු මහතා, වරලත් ප්‍රමාණ සමීක්ෂක හා නීතිඥ

iii. **රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**
ජ්.කේ. සෙනෙවිරත්න මහතා, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්
එම්.එල්. ගම්මම්පිල මහතා, අතිරේක ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
මහාචාර්ය ඩී.ජ්. ප්‍රේමකුමාර ද සිල්වා මහතා, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කලා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය දිල්රුක්ෂි යාපා අබේවර්ධන මිය, දෙපාර්තමේන්තු ප්‍රධානී, ගිණුම්කරණ දෙපාර්තමේන්තුව, කැළණිය විශ්වවිද්‍යාලය
ආචාර්ය මුදිත් සුජීව මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගිණුම්කරණ දෙපාර්තමේන්තුව, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය

iv. **ආරක්ෂක අමාත්‍යාංශය**
ඩබ්.ජ්. සරත් කුමාර මහතා, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්
එස්.එල්. ධම්මිකා කේ. විජයසිංහ මිය, අතිරේක ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
අජිත් චන්ද්‍ර මහතා, ප්‍රසම්පාදන උපදේශක
විශ්‍රාමික රියර් අද්මිරාල්, වයි. එම්. ජයරත්න මහතා, හිටපු නාවික හමුදා කාර්යමණ්ඩල ප්‍රධානී
විශ්‍රාමික අද්මිරාල්, රවීන්ද්‍ර විජේගුණරත්න මහතා, කළමනාකාර අධ්‍යක්ෂ, ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව

v. **මහජන ආරක්ෂක අමාත්‍යාංශය**
ඩබ්.ජ්. සරත් කුමාර මහතා, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්
එම්.එස්.පී. සූරියප්පෙරුම මිය, අතිරේක ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය
සජීව මැදවත්ත මහතා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
ජගත් අබේසිරිගුණවර්ධන මහතා, ආරක්ෂක උපදේශක, මන්ව් සමූහය
එල්. යූ. හෙට්ටිආරච්චි මහතා, හිටපු ප්‍රධාන මූල්‍ය නිලධාරී, මහජන ආරක්ෂක අමාත්‍යාංශය

vi. අධ්‍යාපන අමාත්‍යාංශය

ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, නීති කටයුතු දෙපාර්තමේන්තුව
එම්. එන්. රණසිංහ මහතා, ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
අයි. එම්. කේ. බී. ඉලංගසිංහ මහතා, අතිරේක ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
මහාචාර්ය රොහාන් සමරජීව මහතා, සභාපති, LIRNEasia
ආචාර්ය හර්ෂ අලස් මහතා, සභාපති, ගේට්වේ සමූහය
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා

vii. සෞඛ්‍ය අමාත්‍යාංශය

ආර්.එච්.ඩබ්.ඒ. කුමාරසිරි මහතා, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
වෛද්‍ය පී.එල්. අතපත්තු මහතා, අධ්‍යක්ෂ, සෞඛ්‍ය අමාත්‍යාංශය
මහාචාර්ය වජිර දිසානායක මහතා, පීඨාධිපති, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
විශ් ගෝවින්දසාමි මහතා, සභාපති, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය
මහාචාර්ය මනුජ් වීරසිංහ මහතා, දෙපාර්තමේන්තු ප්‍රධානී, ප්‍රජා වෛද්‍ය විද්‍යා දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

viii. කෘෂිකර්ම අමාත්‍යාංශය

අයන්ති ද සිල්වා මිය, අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
කේ.ජී.ඩී.එන්. ජයසිංහ මිය, ප්‍රධාන ගණකාධිකාරී, කෘෂිකර්ම අමාත්‍යාංශය
රංජිත් පේජ් මහතා, නියෝජ්‍ය සභාපති/සමූහ ප්‍රධාන විධායක නිලධාරී, කාර්ගිල්ස් (ලංකා) පී.එල්.සී.
මහාචාර්ය බුද්ධි මාරඹේ මහතා, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, බෝග විද්‍යා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අධ්‍යයන පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
බී.ජී. චමින්ද මහතා, හිමිකරු, ලුම්බිණි තේ කර්මාන්තශාලා

ix. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

කේ.ඒ. විමලේන්දිරාජා මහතා, අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
ඩබ්.එම්.ඩී.ටී. වික්‍රමසිංහ මිය, අතිරේක ලේකම් (ප්‍රතිපත්ති හා මෙහෙයුම්), වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
ආචාර්ය අනුර ඒකනායක මහතා, ආර්ථික විශේෂඥ
ආචාර්ය රොෂාන් රාජදුරෙයි මහතා, කළමනාකාර අධ්‍යක්ෂ, හේලීස් වැවිලි සමාගම, හේලීස් පී.එල්.සී.
සුනිල් පොහොලියද්දේ මහතා, කළමනාකාර අධ්‍යක්ෂ, ලංකෙම් තේ සහ රබර් වැවිලි (පුද්.) සමාගම

x. වාරිමාර්ග අමාත්‍යාංශය

අජිත් අබේසේකර මහතා, අධ්‍යක්ෂ ජනරාල්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
ඉංජිනේරු පී.එම්. ජයධීර මිය, අතිරේක ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය
ඉංජිනේරු ඊ.ඒ.සී.කේ. එදිරිසූරිය මහතා, අධ්‍යක්ෂ (තාක්ෂණික විගණන), වාරිමාර්ග අමාත්‍යාංශය
මහාචාර්ය ලලිත් රාජපක්ෂ මහතා, සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, ඉංජිනේරු පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය
ඩී. විදානගමාච්චි මහතා, හිටපු භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්
මහාචාර්ය එස්.බී. වීරකෝන් මහතා, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය